**ශ්‍රී ලංකා මළළ ක්‍රීඩා සංගමය- 2024**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා මළළ ක්‍රීඩා සංගමයේ (“සංගමය”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සහ 1993 අංක 47දරන ක්‍රීඩා (සංශෝධන) පනතේ 9 වගන්තියෙන් සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 21(අ) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංගමයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ පිළිබිඹු වන පරිදි පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සංගමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංගමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංගමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංගමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධවපරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂයපථය

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංගමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංගමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංගමය ක්‍රියා කර ඇති බව,

- සංගමය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සංගමයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණ**

**1.5.1 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| අයිතමය | මූල්‍ය ප්‍රකාශන අනුව රු. | අදාල වාර්තා අනුව රු. | වෙනස රු. | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සහ ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ වාර්තා අතර මූල්‍ය ප්‍රදානවල වෙනස | 112,635,334 | 51,489,187 | 61,146,147 | අපගේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගය නිවැරදි බව අපි ප්‍රකාශ කරමු. | ප්‍රදාන සැසඳුම් කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.641,744 ක විදුලි බිල්පත වසර 5 ක් ගතවී තිබුණද පියවා නොතිබුණි. | සංගමයේ මූල්‍ය තත්ත්වය යහපත් වූ වහාම සම්පූර්ණ මුදල ගෙවීමට තීරණය කර ඇත. | ගෙවිය යුතු දෑ ප්‍රමාදයකින් තොරව පියවිය යුතු වේ. |

**1.6.2 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා මලල ක්‍රීඩා උප සභාපතිවරයා 2024 අගෝස්තු 22 වන දින 2024 U-20 ලෝක ශූරතාවලිය සඳහා රු. 3,725,895 ක අත්තිකාරම් මුදලක් ලබාගෙන තිබුණි. 2024 දෙසැම්බර් 31 වන විට එයින් රු. 3,054,460 ක් පමණක් පියවා තිබුණද, රු. 671,434 ක හිඟ ශේෂය මාස 09 ක ප්‍රමාදයකින් පියවා තිබුණි. | උප සභාපතිවරයා නොදැනුවත්වම U-20 ලෝක ශූරතාවලිය සඳහා රු.671,434 ක අතිරික්තයක් ගෙවා ඇත. කෙසේ වෙතත්, මෙම සම්පූර්ණ මුදල දැන් උප සභාපතිවරයා විසින් ගෙවා පියවා ඇත. | අත්තිකාරම් ගෙවීම සහ පියවීම සඳහා නිසි යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | 2024 මැයි 03 දිනැති අංක 2382/32 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2024 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් රෙගුලාසි | | | |
| (i) | 3 (1) (i) වගන්තිය | මෙම රෙගුලාසි ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට මාස 03ක් ඇතුළත ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමයේ ව්‍යවස්ථාව ලියාපදිංචි කිරීම සඳහා ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණද, එසේ සිදුකර නොතිබුණි. | එය නොපමාව ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයාට යැවීමට මම පියවර ගන්නෙමි. | සංගමය ක්‍රීඩා රෙගුලාසි වලට අනුකූල විය යුතුය. |
| (ii) | 3 (1) (ii) වගන්තිය | වත්මන් ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ මට්ටම, අදාළ කාල සීමාව තුළ අපේක්ෂිත ඉලක්කය සහ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා උපාය මාර්ග ඇතුළුව ඉදිරි වසර 10 සඳහා සංයුක්ත සැලැස්මක් ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | සෑම වසරකම දේශීය හා ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ සහ ඒවායේ දිනයන් පුරෝකථනය කිරීමෙන් වසර 10 ක සැලැස්මක් සකස් කිරීම ප්‍රායෝගික නොවේ. | සංගමය ක්‍රීඩා රෙගුලාසි වලට අනුකූල විය යුතුය. |
| (iii) | 6 (xxvii) වගන්තිය | ක්‍රීඩා සමාජ, ආයතන, දිස්ත්‍රික් ක්‍රීඩා සංගම්, පළාත් ක්‍රීඩා සංගම් හෝ දිස්ත්‍රික්කයකට හෝ පළාත් සංගමයකට අනුබද්ධිත ක්‍රීඩා සමාජවල නිලධාරීන් තෝරා පත් කර ගැනීම ඇතුළු සියලු ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර වාර්ෂිකව ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය වුවද, මෙතෙක් එය ඉදිරිපත් කර නොතිබුණි. | සියලු තොරතුරු ලැබුණු පසු, ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | සංගමය ක්‍රීඩා රෙගුලාසි වලට අනුකූල විය යුතුය. |

## 1.8 බදු රෙගුලාසි වලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සහ එයට කරන ලද සංශෝධනවලට අනුව, ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය තම බදු අය කළ හැකි ලාභය මත ආදායම් බදු ගෙවීමට බැඳී සිටියද, මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මලල ක්‍රීඩා ආයතනය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොතිබුණි. | බදු ගෙවීමේ අවශ්‍යතාවයක් නොමැති බව අපගේ බදු උපදේශකයින් අපට දන්වා ඇත. | සංගමය බදු රෙගුලාසි වලට අනුකූල විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සංගමයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,353,125 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.13,813,078 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.19,166,203 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පසුගිය වර්ෂයට සාපේක්ෂව අමාත්‍යාංශ ප්‍රදාන රු.85,306,301 න් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

පෙර වර්ෂය හා සසඳන විට, සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමවල වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතයේ විශ්ලේෂණය පහත දැක්වේ.

| විස්තරය | 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු.මිලියන | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු.මිලියන | විචලනය වාසිදායක/ (අවාසිදායක) රු.මිලියන | ප්‍රතිශතය % |
| --- | --- | --- | --- | --- |
| **ආදායම** | | | | |
| අමාත්‍යාංශ ප්‍රදාන | 112.6 | 27.3 | 85.3 | 312.0 |
| වෙනත් ආදායම් | 22.4 | 26.0 | (3.6) | 13.8 |
| **වියදම්** | | | | |
| පරිපාලන වියදම් | 5.9 | 5.9 | 0 | 0 |
| ජාත්‍යන්තර තරඟ වියදම් | 54.1 | 21.8 | (32.3) | 148.2 |
| දේශීය තරඟ වියදම් | 5.6 | 7.4 | 1.8 | 24.3 |
| ජාතික පෝෂණ දීමනාව | 51.1 | 21.1 | (30) | 142.2 |
| වෙනත් වියදම් | 12.9 | 11.1 | (1.8) | 16.2 |

වෙනත් ආදායම් තුල ඇතුළත් අනුග්‍රාහක ආදායම පෙර වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ රු.6,700,230 කින් හෙවත් සියයට 89 කින් අඩු වී තිබුණි. එබැවින්, තරඟාවලි සඳහා අනුග්‍රාහක ආදායම වැඩි කර ගැනීමට කළමනාකරණය පියවර ගත යුතුය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ප්‍රසම්පාදන කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රු.1,341,260 ක් වටිනා අයිතම පහක් (05) ප්‍රසම්පාදනය කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණි. එබැවින්, එම ප්‍රසම්පාදනවල විනිවිදභාවය සහ ආර්ථිකභාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | පිළිතුරු ලැබී නොමැත. | සංගමය විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු වේ. |